සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / දෙවන වාරය - ජූලි මාසය - 1 සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වී. අසංක දේශප්‍රිය අබේරත්න.

# 22 ඒකකය - කාලය 2


ක්‍රියාකාරකම 1

- ඔරලෝසු මුහුණතක් සපයා ගන්න.
- ඔබේ දබර ඇඟිල්ල මිනිත්තු කටුව ලෙස සිතන්න.
- 12 අංකය ට ඔබේ දබර ඇඟිල්ල තබා ගන්න. බිංදුව ලෙස කියන්න.
- 1 අංකයට 5
- 2 අංකයට 10 ආදි වශයෙන් ඔරලෝසුවේ අංක මතට ඇඟිල්ල තබමින් 5 න් 5 ට ගණන් කරන්න.
- එම ක්‍රියාකාරකම අවස්ථා කිහිපයක් සිදු කරන්න.
- එසේ නම් මිනිත්තු කටුවට ඔරලෝසුවේ සෑම ඉලක්කමක් උඩ දීම වටිනාකමක් ඇති බව ඔබට වැටහෙනවා නේද ?
- මිනිත්තු කටුව එක ඉලක්කමක සිට තවත් ඉලක්කමක් මතට ගමන් කිරිමේදි මිනිත්තු 5ක් පසු කරන බව වටහා ගන්න.


ක්‍රියාකාරකම 2

- එකිනෙකට වෙනස් වේලාවන් සඳහන් කර පත්‍රිකා කිහිපයක් සාදා ගන්න.
- මේ ආකාරයට සකස් කර ගත් පත්‍රිකා රෝල් කර බඳුනකය දමන්න.
- එයින් එකක් වෙනත් අයෙකුට අහඹු ලෙස ගැනීමට කියන්න.
- එහි සඳහන් වන වේලාව ඔබගේ ඔරලෝසුවේ සකස් කරන්න.
- වේලාව නිවැරදිදැයි වැඩිහිටියෙකු සමග සාකච්ඡා කරන්න.
- නිවැරදි නම් අභ්‍යාස පොතේ ඔරලෝසු මුහුණතක් ඇඳ වේලාව සටහන් කරන්න.


2. පහත දැක්වෙන ඔරලෝසු මුහුණත්වල දක්වා ඇති වේලාවන් තිත් ඉර මත ලියන්න




______________________



______________________




______________________




______________________

පහත දක්වා ඇති වේලාවන් ඔරලෝසු මුහුණත් වල ඇද දක්වන්න.




වේලාව 8.00




වේලාව 11.00